අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்
Department of Technical Education and Training
Pioneer Organization in Providing Technical Education and Training in Sri Lanka

තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10. ப.பெ. 557,ஓல்கொட் மாவத்தை, கொழும்பு 10. P.O. Box 557, Olcott Mawatha, Colombo 10

මගේ අංකය : எமது இல : My No : DTET/04/02/02/වැ.සහ.බද.පරි. සංශෝධන/පොදු

ඔබේ අංකය : உமது இல : Your No :

දිනය : திகதி: Date : 2026.09.30

29 OCT 2026
Management Information Unit
DTET

අධ්‍යක්ෂ/ විදුහල්පති
තාක්ෂණ/ කාර්මික විද්‍යාලය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.

උක්ත කරුණ සම්බන්ධව අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශයේ ලේකම්ගේ අංක MOE/VESD/ADM/11/64/2025 හා 2026.07.23 දිනැති ලිපිය හා බැඳ.

02. ඒ අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සංශෝධනයන් ඇමුණුම 01 මගින් මේ සමඟ ඉදිරිපත් කරමි.

ඩී.වත්සලා මාරඹගේ
අධ්‍යක්ෂ ජනරාල්

කාර්යාලය அலுவலகம் Office 011-2348896 011-2348897 011-2439078
ෆැක්ස් தொலைநகல் Fax 011-2439077
E-mail:- info@dtet.gov.lk
Website:- www.dtet.gov.lk
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන) மேலதிக பணிப்பாளர் நாயகம் (தொழில்நுட்பக் கல்வி) A.D.G (Technical Education) 011-2437103
011-2348895

දුරකථන
Telephones
011-2136600
011-2136650

කොමිසම් සභාපතිගේ ලේකම්
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/8/1/111/5/2013

ඔබේ අංකය
உமது இல.
Your No.
MOE/VESD/AD M/11/64/2023

දිනය
திகதி
Date
2026.07.16

ලේකම්

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2026.01.09 දිනැති ලිපිය හා බැඳේ.

02. යටෝක්ත කරුණ සම්බන්ධයෙන් සලකා බලන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මේ සමඟ ඇති ඇමුණුම 01 පරිදි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බව එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කර, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පටිපාටියෙහි සටහන් කර තබන ලෙස වැඩිදුරටත් දන්වමි.

දේශමාලී කුමාරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය

සංශෝධන ලැයිස්තුව

අනු අංකය	ඡේද අංකය	සංශෝධනය විය යුතු ආකාරය
01	3.3	පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය: ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා /හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූ ද, ඒකල ස්වරූපයේ වූ ද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීමේ බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.
02.	05.	වැටුප් 5.1 වැටුප් කේත අංකය: MN 1 - 2025 5.2 මාසික වැටුප් පරිමාණය :රු.45,230 - 10x540 - 11x630 – 10x890 – 10x1,190 – 78,360/- 5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	ආරම්භක වැටුප් තලය (රු.)
III	පියවර 01	45,230/-
II	පියවර 12	51,260/-
I	පියවර 23	58,450/-

03	6 6.1	සේවා ගණයට අයත් තනතුර/ තනතුරු අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන්

අනුමත තනතුරු නාම	තනතුර අනුමත ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
වැඩහල් සහකාර	III/II/I	38	ii. වැඩහල්වල/ පරිගණක කාමරවල පවතින ඌනතා අතිරික්ත වාර්තා කිරීම. iii. වැඩහල්වල/ පරිගණක කාමරවල කළ යුතු අළුත්වැඩියාවන් හා සේවාවන් පිළිබඳ වාර්තා කිරීම.

<table>
<tr><td>04</td><td>7.2.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය: යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.</td></tr>
<tr><td>05</td><td>7.2.4.3</td><td>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.</td></tr>
<tr><td>06</td><td>7.2.4.4.1</td><td>යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා: කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්</td></tr>
<tr><td>08</td><td>7.3.2</td><td>
<table>
<tr><th>තනතුර</th><th>අයදුම් කළ හැකි දෙපාර්තමේන්තුගත ප්‍රාථමික සේවා ගණයන්ට අයත් තනතුර</th></tr>
<tr><td>කෘෂි කොන්දොස්තර</td><td>කෘෂි කම්කරු</td></tr>
<tr><td>පරිශ්‍ර පාලක</td><td>පෙදරේරු, වඩු කාර්මික, විදුලි කාර්මික</td></tr>
<tr><td>වැඩහල් සහකාර</td><td>විදුලි කාර්මික, වැද්දුම්කරු, යන්ත්‍ර ශිල්පී, පෙදරේරු, වඩු කාර්මික, රසායනාගාර සහායක</td></tr>
</table>
සුදුසුකම්: කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික සේවා ගණයන්හි සේවය කරන අදාළ සුදුසුකම් සපුරා ඇති නිලධරයන්ට පහත උපලේඛනයේ සඳහන් ආකාරයට මෙම තනතුරු සඳහා අයදුම් කළ හැකිය. අයදුම්කරුවන් ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.</td></tr>
<tr><td>09</td><td>7.3.2.2.3</td><td>වැඩහල් සහකාර : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් යාන්ත්‍රික/ සිවිල්/ පරිගණක ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) 4 වන මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.</td></tr>
<tr><td>10</td><td>7.3.2.5</td><td>වෙනත්:
i. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 සිට 7.3.3 දක්වා සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැයට පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා වක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික වක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.</td></tr>
</table>

11	7.3.4.4	යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : මේ යටතේ ඇති වගුව එලෙසම පවතී.
12	7.3.4.4.1	යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
13	8.2	කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද: අවම වශයෙන් වසරකට වරක්
14	09 9.1	භාෂා ප්‍රවීණතාවය භාෂාව: රාජ්‍ය භාෂාව ලබා ගත යුතු ප්‍රවීණතාවය: රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03ක් ඇතුළත ලබා ගත යුතුය. භාෂාව: අනෙක් රාජ්‍ය භාෂාව ලබා ගත යුතු ප්‍රවීණතාවය: රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික වක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.
15	10.1 10.1.1 10.1.1.1	III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම. සාමාන්‍ය කාර්ය සාධනය අනුව, සපුරාලිය යුතු සුදුසුකම්: IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා වක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික වක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
16	10.2 10.2.1 10.2.1.1	II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම. සාමාන්‍ය කාර්ය සාධනය අනුව, සපුරාලිය යුතු සුදුසුකම්: II. රාජ්‍ය සේවා කොමිෂන් සභා වක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික වක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
17	13.	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන: අදාළ නොවේ.
18	17	අන්තර්කාලීන විධිවිධාන: අදාළ නොවේ.

19	ඇමුණුම 02	3. පවත්වනු ලබන බලධරයා: 8.3 වගන්තිය පරිදි 4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: අවම වශයෙන් වසරකට වරක්
19.	ඇමුණුම 03	3. පවත්වනු ලබන බලධරයා: 8.3 වගන්තිය පරිදි 4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: අවම වශයෙන් වසරකට වරක්
20.	ඇමුණුම 04	3. පවත්වනු ලබන බලධරයා: 8.3 වගන්තිය පරිදි 4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග: අවම වශයෙන් වසරකට වරක්